52451

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ................................................................ විභාග අංකය :- ....................

24 - 11 - 2016

සැලකිය යුතුයි:

- පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- දෙවැනි කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පළමු කොටසට අමුණා බාර දෙන්න

## I - කොටස

- අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත්ම සුදුසු පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(01) "මිනිසෙකු සිරගත කළත් සිතුවිලි සිරගත කළ නොහැකි ය." ඉහත ප්‍රකාශය කරමින් ලෝකයට බොහෝ දේ සිතන්නට මඟපෑදූ ලේඛකයා කවු ද?

(1) ඈන් ෆ්‍රෑන්ක් (2) ෆ්‍රැන්සිස් බේකන්
(3) මැක්සිම් ගෝර්කි (4) මුනිදාස කුමාරතුංග

(02) වඩාත් උසස් ප්‍රමිතියක් හා ජාත්‍යන්තර පිළිගැනීමක් සහිතව වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා රජය මඟින් ලබාදෙන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකයේ (NVQ) නිපුණතා මට්ටම් කීයක් තිබේ ද?

(1) 4කි. (2) 7කි. (3) 6කි. (4) 3කි.

(03) A. ජීවත්වීමේ අයිතිය
B. පාලකයන් තෝරාගැනීමේ අයිතිය
C. රට තුළ ඕනෑම ස්ථානයක වාසය කිරීමේ අයිතිය
ඉහත දක්වෙන අයිතිවාසිකම් අතරින් සිවිල් අයිතිවාසිකම් දෙකක් පමණක් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) A හා C (2) B හා C (3) A හා B (4) C හා B

(04) ඖෂධ වර්ග භාවිතයේ දී වඩාත් සැලකිලිමත් විය යුතු කරුණ වන්නේ,
(1) රෝගය තරමක් සුව වූ පසු ඖෂධ නොගැනීම
(2) වෛද්‍ය උපදෙස් වලින් තොරව ඖෂධ භාවිත කිරීම
(3) තමන්ට අවශ්‍ය වේලාවට පමණක් ඖෂධ ගැනීම
(4) ඖෂධවල නියමිත මාත්‍රාව ලබාගැනීම හා වෛද්‍ය උපදෙස් මත ක්‍රියා කිරීම

(05) ශ්‍රී ලංකාවේ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කරන්නේ,
(1) සභාපතිවරයා ය. (2) ලේකම්වරයා ය.
(3) නගරාධිපතිවරයා ය. (4) ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ය.

- අංක 6 සිට 10 දක්වා ප්‍රකාශන නිවැරදිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(06) ලද දෙයින් සතුටු වී සමබරව ජීවත්වීම තුළින් පුද්ගලයෙකුට යහපත් ජීවිතයක් ගත කළ හැකි ය. ( )

(07) ප්‍රතිවිරුද්ධ පාර්ශවයන් අතර සංවාදයක් ගොඩනගා පක්ෂපාතීව කටයුතු කිරීම සමථකරුවාගේ කාර්ය භාරය වේ. ( )

(08) තම පවුල තුළින් ආදරය, දයාව කරුණාව හොඳින් නොලැබෙන දරුවන් තුළ ආත්මවිශ්වාසය හා සුරක්ෂිතභාවය ඇති නොවේ. ( )

(09) තාක්ෂණික වෙනස්වීම් සමඟ අප සමාජය තුළ සැමවිටම අහිතකර බලපෑම් ඇති කරනු ලැබේ. ( )

(10) ඒබ්‍රහම් ලින්කන් මහතා කළු ජාතිකයින්ගේ නිදහස උදෙසා විප්ලවීය සටනක් ගෙනගිය ජන නායකයෙකි. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.
(තාක්ෂණය, සාර්ථකත්වයට, අවබෝධය, අපරික්ෂාකාරී, කාර්යක්ෂම, විවිධාංගීකරණයට)

(11) මිත්‍රත්වය අලුත් වෙමින් ඔවුනොවුන් අතර .................................... වර්ධනය වන්නේ නම් ගැටුමක් ඵලදායී විය හැකි ය.

(12) ගෝලීයකරණය නිසා විවිධ සංස්කෘතීන්ට අයිතිවී තිබෙන දැනුම හා .................................... පොදුවේ මුළු ලෝකයේ ම මිනිසුන්ගේ සංවර්ධනයට යොදාගත හැක.

(13) නිදහස් ජන මාධ්‍ය ක්‍රමයක් පැවතීම ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක .................................... හේතුවේ.

(14) අධික වේගයෙන් රිය පැදවීම හා .................................... ලෙස යන්ත්‍ර සූත්‍ර ක්‍රියා කරවීම නිසා අනතුරු සිදුවේ.

(15) කෘෂිකාර්මික අංශය වර්තමානයේ .................................... ලක්වෙමින් පවතින අතර, රැකියා අවස්ථා ද පුළුල් වී ඇත.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(16) නායකයෙකු තීරණ ගැනීමේ දී ඉතා .................................... යුතුව ඵලදායී තීරණ ගතයුතු වේ.

(17) පංචවිධ සංකල්පය ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනයක .................................... ඉහළ නංවාගත හැකි ය.

(18) එකා සැමටත් - සැම එකාටත් යනු .................................... ව්‍යාපාරයේ ආදර්ශ පාඨයයි.

(19) තාක්ෂණය භාවිතය සමාජයට හිතකර මෙන්ම .................................... ලෙස ද බලපා ඇත.

(20) ශ්‍රී ලංකාව අතීතයේ සිටම පළාත් පාලන ක්‍රම ක්‍රියාත්මක කළ රටකි. ඒ අනුව අනුරාධපුර යුගයේ දී .................................... නැමැති පළාත් පාලන ආයතනයක් පැවැති බවට සාධක හමුවී ඇත.

(ලකුණු 2 × 20 = 40)

## II - කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) තුන්වන වාර අවසානයේ ඔබ / ඔබ කණ්ඩායම විසින් "පළාත් පාලන ආයතනවල කටයුතු සඳහා සහාය වෙමු."' මාතෘකාව යටතේ සකස් කළ ප්‍රශ්නෝත්තර සංග්‍රහය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සැකසීමේ දී ඔබට ඔබ කණ්ඩායමට හා අනිකුත් කණ්ඩායම්වලට ලැබුණු විෂය මාතෘකා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පෙළ පොතට අමතරව ඔබ/ඔබ කණ්ඩායම තොරතුරු සපයාගත් මූලාශ්‍ර දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) ප්‍රශ්නෝත්තර සංග්‍රහය සැකසීමට පෙර ඔබට / ඔබ කණ්ඩායමට ගුරුතුමා /තුමිය ලබාදුන් උපදෙස් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) ක්‍රියාකාරකම තුළ ඔබ/ඔබ කණ්ඩායම සකස් කළ ප්‍රශ්න දෙකක් ලියන්න. (ලකුණු 02)

(v) මෙම ක්‍රියාකාරකම කිරීමේ දී ඔබට ලැබුණු නව අත්දැකීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(vi) මෙම ක්‍රියාකාරකම කිරීමේ දී පන්තියේ වෙනත් කණ්ඩායමක් සකස් කළ ප්‍රශ්නයක් හා ඊට අදාළ පිළිතුර සඳහන් කරන්න. (ලකුණු 03)

(vii) මෙම ප්‍රශ්නෝත්තර සංග්‍රහය පන්තියේ දී ප්‍රයෝජනයට ගත් අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03)

(02) ඔබ විවිධ හැකියා හා දක්ෂතාවලින් පරිපූර්ණ ය. ඒවා ප්‍රයෝජනයට ගෙන ජීවිත අභියෝගවලට මුහුණ දෙමින් තම ඉලක්ක කරා පියමැනීමෙන් ජීවිතය ජයගත හැකි ය.

(i) පොත පත කියවීම තුළින් පුද්ගලයාගේ බුද්ධිය තව තවත් වර්ධනය වේ. පහත සඳහන් ප්‍රකාශන ඉදිරිපත් කළ ගත්කතුවරයාගේ නම වරහන් තුළින් තෝරා ඔබේ පිළිතුරු පත්‍රයේ A, B අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A. අකුරට ඔබ වන්න දාස අකුර ඔබට වේය දාස

B. පොතක පිටු අතර සැබෑ මිනිස්සු ජීවත්වෙති.

(තෝරෝ, මුනිදාස කුමාරතුංග, ඊ.එච්.පෝස්ටර්) (ලකුණු 02)

(ii) ශ්‍රී ලාංකික අනන්‍යතාවය පිළිබිඹු වන අංග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ස්ථිරසාර ලෙස කටයුතු කිරීමට සිදුවන අවස්ථා දෙකක් සඳහන් කර, ඒ සඳහා ඔබ විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් කෙටියෙන් විස්තරයක් කරන්න. (ලකුණු 05)

(03) ආණ්ඩුව විසින් ජනතාවගේ යහපත උදෙසා ගනු ලබන තීරණ හා ප්‍රතිපත්ති ජනතා අවශ්‍යතා ඉටුකරමින් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් පාලන ආයතන පිහිටුවා තිබේ.

(i) A. මහනුවර යුගයේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ පළාත් පාලන ආයතනයක්

B. වර්තමානයේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනයක් -

A හා B අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පළාත් පාලන ආයතනවලට මුදල් ලැබෙන මාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයින්ගේ හා නිලධාරීන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

(04) ජීවන ගමනේ විවිධ අවස්ථාවල දී අපට විවිධ තීරණ ගැනීමට සිදුවේ. අභියෝග හමුවේ ඵලදායී නිවැරදි තීරණ ගැනීම තුළින් ජීවිතය ජයගත හැකි ය.

(i) ජීවිත අභියෝග හමුවේ නොසැලී තීරණ ගෙන ලොවට සේවයක් සිදුකළ අමරණීය පුද්ගලයින් දෙදෙනෙකුගේ පින්තූර දෙකක් A හා B වශයෙන් දැක්වේ. ඔවුන් දෙදෙනා හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

A


B


(ii) අප එදිනෙදා ගනු ලබන තීරණ වර්ග තුනකට වෙන්කළ හැකි ය. ඉන් දෙකක් නම් කර ඔබ නම් කළ තීරණ දෙකට උදාහරණය බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) නවවන ශ්‍රේණියේ ඉගෙනගන්නා දරුවෙකුට මුහුණ දීමට සිදුවූ ගැටලුවක් පහත දැක්වේ. මෙම ගැටලුව කියවා ඔබ විසින් ගන්නා ලද නිවැරදි තීරණය සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුර ඔබේ පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

"තමන්ගේ ආදරණීය මාමා මියගොස් තෙමස් පූර්ණ පිංකම කිරීමට පවුලේ අය තීරණය කර ඇත. එහෙත් එදිනට තම පාසලේ අධ්‍යාපන චාරිකාවද යෙදී ඇත. එක් අතකින් තම ආදරණීය මාමාගේ දානමය පිංකම අනික් පැත්තෙන් මිතුරන් සමඟ විනෝදවන සුන්දර අධ්‍යාපන චාරිකාව....

මෙම ගැටලුව ඔබට වූවා යැයි සිතා පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A. මෙම සිද්ධිය තුළ ඔබ හඳුනා ගත් ගැටලුව කුමක් ද?

B. එම අවස්ථාවේ දී ඔබගත් තීරණය ලියන්න.

C. ගැටලුව විසඳා ගැනීමේ දී ඔබට ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?

D. ඉහත ක්‍රියාමාර්ගවල වාසියක් හා අවාසියක් ලියා දක්වන්න.

E. ඔබ මේ අවස්ථාවේ ගන්නා හොඳම ක්‍රියාමාර්ගය කුමක්ද? එයට හේතුවක් දක්වන්න. (ලකුණු 05)

(05) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ජනතා සහභාගීත්වය පදනම් කරගෙන සිදුවන පාලන ක්‍රමයකි.

(i) ශ්‍රී ලාංකික ජනතාව පුරවැසියන් වශයෙන් පාලනයට සහභාගී වීමට (ඡන්දය ප්‍රකාශ කිරීම) ලැබෙන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම ක්‍රියාත්මක වන රටවල් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට බලපාන අංග තුනක් සඳහන් කර ඉන් එක් අංගයක් ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වයට බලපාන ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

52328

24.11.2016 Grade - 9 පුරවැසි අධ්‍යාපනය.

(06) ආපදා පිළිබඳ දැනුවත්වීම මගින් ඒවා වළක්වා ගැනීමටත් හානි අවම කර ගැනීමටත් හැකියාව තිබේ.

(i) ආපදා ඇතිවීමට බලපාන හේතු අනුව ආපදා වෙන් කරනු ලබන කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) A. පහත රූප සටහනේ දැක්වෙන ආපදා අවස්ථාව හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 01)



Learning Resource Center
R
De Mazenod College
Kandana

B. ඉහත ආපදා අවස්ථාව ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) C. අනතුරු හා ආපදා සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

D. අනතුරු හා ආපදා සිදුවූ අවස්ථාවක ක්‍රියා කළ යුතු ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

(07) මූලික නිපුණතා සපුරා ගනිමින් වැඩ ලෝකය ගවේෂණය කර කාර්‍යක්ෂම සේවාවක් කිරීම අනාගත පරපුරේ යුතුකමකි.

(i) රැකියාවක් පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා උපයෝගී කරගත හැකි මාධ්‍යය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රැකියා අපේක්ෂකයන් සඳහා වෘත්තීය පුහුණුව හා වෘත්තීය මාර්ගෝපදේශනය ලබාදීම සඳහා රජය මගින් ගෙන ඇති පියවර හතරක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) රැකියා ලාභියෙකු යහපත් වෘත්තිකයෙකු ලෙස සාර්ථක වීමට ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් සඳහන් කර ඉන් එක් ගුණාංගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)